රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "ඒ" අර්ථසාධක අරමුදල - 2015
---------------------------------------------------------------------------------------

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "ඒ" අර්ථසාධක අරමුදලේ (අරමුදල) 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ ගිණුම හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 ජුනි 01 දිනැති අංක 38/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ 9 වන ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** විගණකගේ වගකීම
----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම
---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "ඒ" අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම

---------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 හි සඳහන් ආකෘතියේ දක්වා ඇති පරිදි පිළියෙල කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු බදු ගිණුමේ රු.439,835 ක් වටිනා හඳුනා නොගත් හා ගැලපුම් නොකරන ලද අසාමාන්‍ය හර ශේෂයක් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ලැබිය යුතු අතිරේක දායක මුදල් ශේෂය සහ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ඊට අනුරූප ශේෂ අතර රු.2,012,953 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

අර්ථ සාධක අරමුදල් "බී" ගිණුමට ගෙවිය යුතු පොළී වශයෙන් රු.18,900 ක වටිනාකමක් විවිධ ණයහිමියන් යටතේ පෙන්වා තිබුණද, එවැනි අගයක ලැබිය යුතු වටිනාකමක් අර්ථසාධක අරමුදල් "බී" ගිණුමේ දක්වා නොතිබුණි. තවද, එකතුව රු.14,524 ක ගෙවිය යුතු ශේෂයක් පියවීමට ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව දීර්ඝ කාලයක සිට අඛණ්ඩව ඉදිරියට රැගෙනවිත් තිබුණි.

### 2.2.4 අවිනිශ්චිත ගිණුම

--------------------

අවිනිශ්චිත ගිණුමේ (හිටපු සාමාජිකයන්) 2004 වර්ෂයේ සිට නිරවුල් නොකර පැවත එන රු.18,268 ක ශේෂයක් දක්නට ලැබුණි.

**3.** මූල්‍ය සමාලෝචනය
------------------------

**3.1** මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ දී මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.534,319 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු.881,137 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.346,818 ක පිරිහීමක් පෙන්නුම් කෙරුනි. මෙම පිරිහීම සඳහා බල පෑ ප්‍රධාන සාධකය වශයෙන් පොළී ආදායම් රු.452,964 කින් සමාලෝචිත වර්ෂයේ දී පහත වැටීම හේතුවී තිබුනි.

**3.2** මෙහෙයුම් සමාලෝචනය
------------------------------

කාර්යය සාධනය
---------------------

අරමුදලේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

- ලංකා රාජ්‍ය උකස් බැංකුවට සම්බන්ධ වූ සියළු සේවකයන් වෙනුවෙන් අර්ථ සාධක අරමුදල් එකතු කිරීම.
- සාමාජිකයන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම.
- අරමුදල සඳහා සාමාජිකයන් සිදුකල දායකත්වයන් පදනම් කරගෙන සාමාජිකයන්ට ණය සැපයීම.

ඉහත කටයුතු සිදු කිරීමට අදාළව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂය හා සංසන්දනය කරන විට, සලකා බලන වර්ෂයේ දී අරමුදලේ මුළු ලැබීම් රු.15,461,793 කින් හෙවත් සියයට 31.5 කින් අඩු වී තිබුණු අතර 2014 වර්ෂය හා සංසන්දනය කරන විට 2015 වර්ෂයේ දී සාමාජිකයන් විශ්‍රාම යාම වැඩිවීම හේතුවෙන් සාමාජිකයන්ට සිදු කළ මුළු ගෙවීම් රු.4,702,328 කින් හෙවත් සියයට 26 කින් සමාලෝචිත වර්ෂය තුළ දී වැඩි වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ  අරමුදලේ මෙහෙයුම් කටයුතුවල සාරාංශයක් පහත දැක්වේ.

| | 2015 | | 2014 | |
|---|---|---|---|---|
| | -------- | | -------- | |
| | රු. | රු. | රු. | රු. |
| ආරම්භක ශේෂය | | 30,687,487 | | 44,147,124 |
| එකතු කළා- අරමුදලට ලැබීම් | | | | |
| • සාමාජික දායක මුදල් | 359,943 | | 500,841 | |
| • බැංකුවේ දායක මුදල් | 539,914 | | 751,262 | |
| • පොළී ආදායම් | 2,072,629 | 2,972,486 | 3,722,539 | 4,974,642 |
| | ------------ | -------------- | ------------ | ------------ |
| | | 33,659,973 | | 49,121,766 |
| අඩුකළා - අරමුදලෙන් ගෙවීම් | | | | |
| • සාමාජිකයන්ට ගෙවීම | | (23,136,607) | | (18,434,279) |
| | | -------------- | | ------------ |
| අවසාන ශේෂය | | 10,523,366 | | 30,687,487 |

( ආ) විගණනය සඳහා ලබා දී ඇති තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂය තුළදී අරමුදලේ සාමාජිකයන්ට කිසිදු ණය මුදලක් ලබා දී නොතිබුණි.